


සිසිර දිසානායක



රටක, ජාතියක සංස්කෘතිය හඳුනාගැනීමේදී ජන කලාවන්ට හිමිවන්නේ අන් සංස්කෘතිකාංගයන්ට නොදෙවෙනි තැනක්. ජන නැටුම්, ජන ගායනා, ජන සිතුවම් කලාවන්, ජන රංගන කැටයම් කලාව වැනි නොයෙක් ඉසව්කරා ජන කලා විහිද යයි. කලාවක් ලෙසින් නොගැනුණද ජන නැටුම් වල එන ගායනා සහ ජන සංගීතය ඇසුරේ එන ජන බස් වහරද සංස්කෘතියක ලකුණු දක්වන තවත් අංගයකි. ජන සංගීතය, ජන කවි, ජන නැටුම්, ජන රංගන මෙන්ම ජන බස් වහරද එකට කැටි

# "රන් සළකුණ"

කොට ගෙන ගීත නිර්මාණය කිරීමෙහි ලා මව්බිමේ පුරෝගාමී මෙහෙවරක යෙදුණු ධීමතෙකි, ලයනල් රන්වල සංගීතවේදියාණන්. මීට දසවසරකට කලින් අකාලයේ අලගෙන් වෙන්ව ගිය රන්වලයන් සිහිගන්වමින් නොවැම්බර් 27 වන ද සවස 6.30 කොළඹ ආනන්ද මහා විද්‍යාලයීය කුලරත්න ශාලාවේදී උත්සවයක් පැවැත්වෙයි. රන්වලයන්ගේ වියෝවයෙන් පසුව එතුමන් කරගෙන ආ කටයුතු ඉදිරියට ගෙන යන කණිටු පුත් සහන් රන්වලයන්ව "ගී සඳළුව" වෙනුවෙන් දුරකථනයෙන් සම්බන්ධ කර ගත්තෙමු.

"ආයුබෝවන් අයියේ" සහන් සිංහල ක්‍රමයට අප හා පිළිසඳරට එක් වීය.

"අපි අයියෙ මේ උත්සවය නම් කරලා තියෙන්නේ "රන් සළකුණ" කියලා ...."රන්වල" නාමයෙන් "රන්" කොටස උකහාගන්නට ඇතැයි සිතෙයි.

"මේ උත්සවයේ නම වගේම තේමා පාඨයකුත් යොදගත්තා. ඒ තමයි "කළුබෝවිල සිට ෆැංජියාජි දක්වා..." තාත්තාගේ ගම කළුබෝවිල. පහුගිය අවුරුද්දේ අපි ලෝකයේ හොඳම ප්‍රාසාංගික ජන ගී කණ්ඩායම විදියට තේරුණ ජාත්‍යන්තර ජන ගී සම්මේලනය තිබුණේ චීනයේ ෆැංජියාජි නුවර. ඉතින් කළුබෝවිල උපන් ලයනල් රන්වල නම් කලාකරුවා, ගුරුතුමා, මාර්ගෝපදේශකයා කරගෙන ආ දේවල් වලත් එතනින් පස්සේ රන්වල ජන ගී කණ්ඩායමේ අපි එකතුවෙලා ෆැංජියාජි නුවර ජයග්‍රහණය වෙනකල් කරගෙන ආ දේවල් වලත් හරස් කඩක් තමයි අපි "රන් සළකුණ" උත්සවයේ ඉදිරිපත් කරන්නේ. ඒ කියන්නේ අපිටම හුරු අපිම හදගත්ත මේ ගමන් මඟ ගැන තමයි අපි මේ ප්‍රසංගයේදී කතා කරන්නේ".

"තාත්තා ඉන්න කාලේ කරපු "අහසෙ ඉන්නවලු" ප්‍රසංගය, තාත්තා නැතිවෙන කාලේ වෙනකොට සියල්ල සැළසුම් කරල තිබුණ "ගම අවුලඤද්ඤදං" ප්‍රසංගය ඒ වගේම අපි කරපු "යුද්දෙටත් ඇවිත් ", "පොඩි අයට ජන ගී", "ත්‍රී", "මේ අවුරුදු කාලේ" කියන හැම ප්‍රසංගයකම අංග "රන් සළකුණ" ට ඇතුලත් වෙනවා. ඒ වගේම අළුත් අංගත් එක් වෙනවා.

සහන් "අපි " යනුවෙන් හැඳින්වූ "රන්වල ජන ගී කණ්ඩායම" මේ වන විට අංශ කීපයකින් යුක්ත වෙයි. "රන්වල බල කාය" ඉන් ප්‍රධාන පිරිසයි. මෙම කලාවන්ට උනන්දුවන, ඒවායේ නියැලෙමින් ඉදිරියේ දී "රන්වල බලකායට" සම්බන්ධ වීමට බලාපොරොත්තු වන තරුණ තරුණියන් සඳහා වන සංචිතයයි "රන්වල මතු පරපුර". "බලකායට" තෝරාගනු ලබන්නේ මෙම සංචිතයෙනි. අනෙක් කණ්ඩායම වන්නේ ළමුන් සඳහා වන "රන්වල ළමා බලකාය" යි.

"අපේ ඔය කණ්ඩායම් වලට අමතරව අපිත් එක්ක එද මෙද තුර කටයුතු කරපු පැරණි ශිල්පීන් වගේම සාමාජික සාමාජිකාවනුත් "රන් සළකුණ" ප්‍රසංගයට දයක වෙනවා අයියේ."

මේ වන විට දිවයිනේ කලා ක්ෂේත්‍රයේත්, මාධ්‍යයන්වලත් වගකිව යුතු තනතුරු හොබවන පැරණි සාමාජික සාමාජිකාවන්ගේ ප්‍රමාණය අති මහත්ය. දිවයිනෙන් බැහැරව සිටින්නන් පිළිබඳව ද කිවයුතුව ඇත්තේ එයමයි. ඊට නිදසුන් මෙරටින්ද දැක්විය හැකියි.

"අපේ උත්සවයේ විශේෂත්ව තුනක් තියෙනවා. පළවෙනි එක තමයි තාත්තා නැතිවෙන්න කිට්ටුව ගායනා කරපු "කැලේ පනින්නේ - කොලේ වහන්නේ නෑ ආයේ..." ගීතය එළිදැක්වීම. අපි මේ ගීතය නම් කරලා තියෙන්නේ "මහ උළුගෙදර" කියලයි. තාත්තා ඉන්න කාලෙදීම මේ ගීතය කොහොමද ප්‍රාසංගිකව ඉදිරිපත් කරන්නේ කියලා සැළසුම් කරලයි තිබුණේ. ඉතින් අපි ඒක තව දුරටත් වැඩි දියුණු කරලා එදට ඉදිරිපත් කරනවා. ඇත්තටම මේ සින්දුව ලියපු ඔයාටත් / එදට අපි එක්ක ඉන්න තිබුණනම් මොන තරම් හොඳද ? සහන්ගේ හඬ හැඟුම්බර වීය.

ගීතයක් නිර්මාණය කිරීමේ දීම එහි රංග වින්‍යාසය සකස් කර ගැනීම ලයනල් රන්වලයන්ගේ ක්‍රමවේදය වීය. තමන් සංගීතය නිර්මාණය කරගැනීමෙන් අනතුරුව ඊට පද යොදනා රචකයාට සිය රංග වින්‍යාසය පැහැදිලි කර දී ඒ අනුව පද ලියවා ගැනීම එතුමන්ගේ සිරිත විය. ගීතයට නාටකීය බවක්, ප්‍රාසාංගික බවක් වචනයෙන් එක් කරවා ගැනීමටත්, ගැමි බස් වහරෙන් එම වචන යොදාවා ගැනීමටත් එතුමා සැම විටම උනන්දු වීය. එමෙන්ම රන්වල කණ්ඩායමේ පිරිස ගැයීමෙන් හා රංගනයෙන් දයක කරවා ගත හැකි වන සේ පද හා අරුත් ලියවා ගැනීම තවත් අවශ්‍යතාවයක් වීය. තමන් කැමති නිමිත්තක් අනුව හා සුදුසු අනුභූතියක් අනුව ගීයේ පදවලින් භූමිකා නිර්මාණය කරගැනීමට එතුමාගේ අවසරය රචකයාට ලැබිණ. මේ කී කාරණා සියල්ල වඩාත් හොඳින් කැපී පෙනෙන ගීයකි "මහ උළුගෙදර" ගීය; නැතහොත් "කැලේ පනින්නේ " ගීතය. මේ ගීයේ ඇතැම් විට එක චරිතයක් ගායනා කරන්නේ වරකට එක වචනයක් හෝ දෙකක් පමණක් විය. ගී පද චරිත සමඟ යෙදී ඇති පිළිවෙල සළකා බැළුවහොත් රචකයා මුහුණ දෙන එම අභියෝගයන් වඩාත් හොඳින් පැහැදිළි වනු ඇත.

"රන් සළකුණ" උත්සවයේ දෙවන විශේෂත්වය තමයි අයියේ නොනවතින ගීත පෙළක්, ඒ කියන්නේ "නන් ස්ටොප්" විදියට ජන ගී ගායනා කිරීම."

"අනික් විශේෂත්වය වෙන්නේ සමරු කලාපයක් වෙනුවට සමරු ඩී. වී. ඩී. තැටියක් කිරීම. ඒ වගේම අපි මෑතකදී කරපු අළුත් නිර්මාණත් උත්සව ප්‍රසංගයට ඇතුල් කළා. ගීත රචකයින් පස් දෙනෙක් එකතුවෙලා ලියපු ගීතයකට අපි පස් දෙනෙක් එකතු වෙලා තනුවක් නිර්මාණය කළා. ඒකට ඔයත් ලිව්වනේ. ඒ ගීතය ඒ මෑතකදී කරපු ගීත අතරින් එක විශේෂ ගීතයක්." අංබිත දර්ශන තැටියක් (ඩිජිටල් විෂුවල් ඩිස්ක් - ඩී. වී. ඩී. ) සමරු කලාපයක් වශයෙන් නිර්මාණය කිරීම සැබැවින්ම නැවුම් අදහසකි. සිය ගමන් මගේ රන් සළකුණු නවීන තාක්ෂණයට අනුව සනිටුහන් කිරීම රසිකයිනට වචනයෙ පරිසමාප්තාර්ථයෙන්ම "අපූරු" අත්දැකීමක් වනු ඇත.

"රන් සළකුණ" බලන්න නොලැබෙන අයට අපි " ගයමු" ප්‍රසංගයට එක් වෙන්න කියලා ආරාධනා කරනවා..." සහන් අවසන් වශයෙන් ඇරයුමක් කළේ සාකච්ඡාව නිමා කරමින්. අපි ඔහුට ස්තුතිවන්ත වුයෙමු.

සෑම මසකම අවසන් සෙනසුරාද කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ "කමතේ" දී

| | | |
|---|---|---|
| අයියා | : | කැලේ පනින්නේ<br>කොලේ වහන්නේ - නෑ ආයේ<br>කරදර දෙන්නේ<br>හිරිහැර දෙන්නේ - නෑ ආයේ |
| පිරිමි | : | වහන් වී ඉඳලා |
| ගැහැණු: | | නෑ - නෑ - නෑ<br>සපිරි ගේ තැපලා ! |
| පිරිමි | : | මේ ගොයියා ? |
| පිරිස | : | ගමට ඇවිදිල්ලා ! |
| අයියා | : | වහන් වෙන්නේ මොටදැ<br>බොලන්නේ |
| පිරිස | : | මොනව - මොනව - මොනව<br>කිව්වා ? |
| අයියා | : | කූරු ගැන ගැන මං උන්නා |
| පිරිස | : | ඔහෙ පළයන් ! ඔහෙ පළයන් ! |
| අයියා | : | කූරු ගැනල ම ඇඟ හිරි<br>වැටුණා<br>ආයෙ උළු ගෙට නෑ යන්නේ .... |
| පිරිස | : | අඬහැරේ පාලා |
| ගැහැණු: | | හේ - හේ - හේ<br>ගමට කියපල්ලා |
| පිරිමි | : | හනි - හනිකේ |
| පිරිස | : | අයිය ඇවිදිල්ලා ..... |
| අයියා | : | දෑත දෙපයේ හයිය තියෙන්නේ ! |
| පිරිස | : | නැතුව ? - නැතුව ? - නැතුව<br>අයියේ ? |
| අයියා | : | හේන ගිනි ලා පෙරළන්නා |
| පිරිස | : | ඇන්නෑවයි ! - ඇන්නෑවයි ! |
| අයියා | : | කාට කාටත් අත හිත දීලා<br>ගමේ ඉන්නම් "අයියා" වගේ ! |
| ගැහැණු: | | බෙරේ ගහපල්ලා |
| පිරිමි | : | හේ - හේ - හේ<br>සොකරි නටපල්ලා |
| ගැහැණු: | | මේ කමතේ |
| පිරිස | : | අයිය ඇවිදිල්ලා .....! |

සැවොම එක්ව ගයනා ගී පැදුරයි "ගයමු" ප්‍රසංගය එද මෙද තුර ජනප්‍රිය වු ගීත රන්වල කණ්ඩායමත් සමඟ ගැයීමට එක්විය හැකියි, සැමටම.

අවසන් වශයෙන් "කැලේ පනින්නේ" ගීය පිළිබඳව කෙටි සටහනක් තබමින් "ගී සඳළුව" නිම කිරීමට අදහස් කළෙමු. සාමාන්‍යයෙන් නිර්මාණයකට ගොනු කර ගැනීමට උත්සාහ නොකරන සමාජයේ කළු චරිතයක් වටා ගීතය ලිවීමට අදහස් කළෙමු. ගමේ සිටින මැරවරයෙකු නිමිත්ත කොට ගෙන ලියැවුණ මෙම ගීතයේ සාමාන්‍යයෙන් "අයියා" නමින් වහරෙහි හඳුන්වන "අයි. ආර්. සී" කාර පුද්ගලයෙකු හිර ගෙදරින් නිදහස්ව ගමට නැවත පැමිණෙන අවස්ථාවක් ප්‍රසාංගිකව ඉදිරිපත් කිරීමට ගත් උත්සාහයකි මේ.

සිර ගෙදරින් නිදහස් ව ආවද "කළු චරිතයක් ලෙසින් එවැන්නන් සමාජයෙන් කොන්කිරීමය, සිරිත. ඒ නිසාවෙන් ම නැවත දුසිරිතට එක්වන්නෝය, ඔවුහු. එසේ වුවද, පුනරුත්ථාපනය වී නැවත සමාජයට එක්වන ඔවුන් වඩාත් පළදායී ලෙස මෙහෙවරක යෙදෙන්නෙ නම් ? මැරවරයින් හැඳින්වීමට යොදන "අයියා" යන්නෙහි අරුත ඊට ඉඳුරාම වෙනස් අදහසක් දෙන "අයියා" වචනයකට පෙරළවීමට එය බොහෝ සේ ඉවහල් වනවා නොවේද ? එසේ වුවහොත් කා හටත් උදව් පදව් කරගෙන ජිවත් වන වැඩිමල් සොහොයුරෙකු ලෙසින් " අයියා" වදන අර්ථවත් වනු ඇත.

මෙවන් පද පෙළක් නොබියව ගායනා කිරීමට නොපසුබට වු ලයනල් රන්වල ඇදුරු තුමනි, ඔබට නිවන් සුව !

## සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සීහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

***ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......***

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com